**IN THE HIGH COURT OF GAMPAHA OF THE DEMOCRATIC SOCIALIST REPUBLIC OF SRI LANKA**

*In the matter of an Application for Bail in terms of Section 13 of the Bail Act No. 30 of 1997 and Section 10 of the Offensive Weapons Act No. 18 of 1966 and the Explosives Act*

HC Case No:339/20

MC Case No:B1536/20

Officer in Charge
Colombo Crime Division
185" Kolonnawa Rd,
Colombo 9.

***Complainant***

V

Gnendra Shani Abeysekara
No.L/1/1, Elvitigala Flats,
Colombo 08

***Accused***

**And now between**

**Kamani Shriyantha Abeysekara**
No.L/1/1. Elvitigala Flats
Colombo 8

***Petitioner***

V

1. Officer in Charge
   Colombo Crime Division
   185, Kolonnawa Rd,
   Colombo 09

   ***Complainant-Respondent***

2. Hon. Attorney General
   Attorney General's Department
   Colombo 12

   ***Respondent***

3. Gnendra Shani Abeysekara

   ***Suspect – Respondent***

   (Presently at Remand Prison)

09 DEC 2020

Scanned with CamScanner

**ගම්පහ මහාධිකරණයේදී ය.**

**මහාධිකරණ විනිසුරු නිමල් රණවීර මැතිතුමා ඉදිරිපිටදී ය.**

(සටහන් කිරීම : ල/ලේ මනෝරි පෙරේරා විසිනි)

**නඩු අංකය :- 339/2020/ඇප**

**දිනය :- 2020.12.09**

**නියෝගය**

අංක 339/2020 දරණ ඇප ඉල්ලුම් පත්‍රය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ හිටපු අධ්‍යක්ෂක වන ශානි අබේසේකර යන පලමු සැකකරු වෙනුවෙන්ද, අංක 374/2020 දරණ ඇප අයදුම් පත්‍රය ශානි අබේසේකර නිලධාරියා යටතේ සේවය කරන ලද නිලධාරියෙකු වන සුගත් මෙන්ඩිස් යන දෙවන සැකකරු සම්බන්ධයෙන් වේ.

මෙම ඇප අයදුම් පත්‍ර දෙකටම අදාල වන්නේ ගම්පහ මහේස්ත්‍රාත් අධිකරණ නඩු අංක බී1536/20 දරණ නඩුවයි. එම නඩුවේ ශානි අබේසේකර පලමු සැකකරු ලෙසත්, සුගත් මෙන්ඩිස් දෙවන සැකකරු ලෙසත් නම් කොට මහේස්ත්‍රාත් අධිකරණයට කරුණු වාර්තා කර ඇත. ඒ අනුව එම සැකකරුවන් දෙදෙනාට විරුද්ධව දණ්ඩ නීති සංග්‍රහයේ 189, 190, 191 සහ 192 යටතේත් පීඩාකාරී ආයුධ පනතින් සහ තුවක්කු ආඥා පනත යටතේ ආයුධ විශාල සංඛ්‍යාවක් සන්තකයේ තබා ගැනීම සම්බන්ධයෙන් සහ බොරු සාක්ෂි නිර්මාණය කිරීම සම්බන්ධයෙන් විමර්ශන පවත්වන බවට කරුණු දක්වා අත්අඩංගුවට ගෙන ඉදිරිපත්

මහාධිකරණය ලේඛනාගාරය
09 DEC 2020
ගම්පහ.

Scanned with CamScanner

කිරීමෙන් පසුව මහේස්ත්‍රාත් අධිකරණය විසින් රිමාන්ඩ් භාරයට පත්කර ඇත.

ඒ අනුව මෙම සැකකරුවන් දෙදෙනා සම්බන්ධයෙන්ම ඉහත අංක 02 යටතේ ඇප අයදුම් පත්‍ර දෙකක් ඉදිරිපත් කර ඇති අතර, එම අයදුම් පත්‍ර දෙකම එකම සිද්ධියක් සහ ක්‍රියාදාමයක් පදනම් කරගෙන කරනු ලබන ඉල්ලුම්පත්‍ර බැවින් එම දෙකෙහිම කරුණු වෙන් වෙන්ව සළකා බලන අතර, සමහර පොදු කරුණු සහ එක්ව ඉදිරිපත් කරන කරුණු ඇති බැවින් මෙම නියෝගය මෙලෙස එම ඉල්ලුම් පත්‍ර දෙකටම බලපාන පරිදි එක්ව ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.

තවදුරටත් එම අංක යටතේ අදාල සැකකරුවන් වෙනුවෙන් නීතීඥ මහත්වරුන් දෙදෙනෙක් වෙන් වෙන්ව කරුණු වාචිකව ඉදිරිපත් කරන ලද අතර, ඊට අදාලව නීතිපති තුමා වෙනුවෙන් පෙනී සිටි නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල්වරයා ප්‍රතිචාර දක්වා ඇති අතර, තවදුරටත් ඉහත අංක 374/20 දරණ ඉල්ලුම් පත්‍රයට අදාලව දෙවනුව නීතිපතිවරයා වෙනුවෙන් කරුණු දැක්වීමේදී නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල්වරයා මෙම අධිකරණයට සඳහන් කර ඇත්තේ අංක 339/2020 දරණ ඇප අයදුම් පත්‍රය සම්බන්ධයෙන් දක්වන ලද විරෝධතා කරුණුම 374/2020 දරණ ඇප අයදුම් පත්‍රයටද අදාල කර ගන්නා ලෙසට සහ තවදුරටත් ඊට අදාලව වාචිකව කරුණු ද දක්වන ලද බවයි.

ඇප අයදුම් පත්‍ර දෙකම සම්බන්ධයෙන් විරෝධතා වාර්තා ඉදිරිපත් කිරීමෙන් පසුව දෙපාර්ශ්වයම වාචිකව දීර්ඝ ලෙස කරුණු දක්වන ලදී.

09 DEC 2020
ගම්පහ.

Scanned with CamScanner

එමෙන්ම පෙත්සම් සහ දිවුරුම් පෙත්සම් සමඟ ලේඛනද මෙම අයදුම් පත්‍ර දෙකටම අදාලව සැකකරුවන් වෙනුවෙන් ඉදිරිපත් කර ඇත. ඒ අනුව එකී දක්වන ලද වාචික කරුණුත්, ලිඛිතව ඉදිරිපත් වී ඇති ලේඛන සහ අනෙකුත් කරුණුත් මා ඉතා සුපරික්ෂාකාරීව සළකා බලන ලදී.

සැකකරුවන් වෙත මහේස්ත්‍රාත් අධිකරණයට බී1536/20 යටතේ ඉදිරිපත් වී ඇති කරුණු මොනවාද යන්න කෙටියෙන් පහත පරිදි විස්තර කරමි.

එකී විස්තරවලට අනුව මෙම නඩුවේ 1, 2 සැකකරුවන්ට එරෙහිව ඉහත කී පරිදි බොරු සාක්ෂි සෑදීම සහ පීඩාකාරී ආයුධ සන්තකයේ තබා ගැනීම පිළිබඳව චෝදනා නැඟීමට නිර්මාණය වූ පසුබිම පිළිබඳව මෙම නියෝගයේදී පොදු වශයෙන් අධිකරණයට ඉදිරිපත් වී ඇති කරුණු මෙම නඩුවට අදාලව පවතින කරුණුවල සුවිශේෂීව පවතින සංකීර්ණභාවය හේතුවෙන් මූලිකවම පහත එම කරුණු කෙටියෙන් සටහන් කිරීම මෙම නියෝගයේ පැහැදිලිතාවය සඳහා උචිත බව මා සිතමි. ඒ අනුව එකී පසුබිම නිර්මාණය වීමට අදාල වූ පොදු කරුණු මා පහත පෙළගස්වමි.

01. මොහොමඩ් සියාම් නමැති අයෙකු වෙඩි තබා ඝාතනය කිරීම සම්බන්ධව 2013 වර්ෂයේ හිටපු නියෝජ්‍ය පොලිස්පති වරයෙකු වන වාස් ගුණවර්ධන යන අයට එරෙහිව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව කටයුතු කර ඇත.

මහාධිකරණය ලේඛනාගාරය
09 DEC 2020
ගම්පහ.

Scanned with CamScanner

02. එම විමර්ශනවල ප්‍රතිඵලයක් ලෙස කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයට නඩු අංක බී 3279/5/13 යටතේ කරුණු වාර්තා කර ඇත.

03. එකී ඝාතනයට අදාල විමර්ශනවලදී එකී හිටපු නියෝජ්‍ය පොලිස්පති වාස් ගුණවර්ධන නමැති අය යටතේ සේවය කල පොලිස් පරීක්ෂක විල්ලවආරච්චි යන අයෙකු විසින් කරන ලදැයි කියන ප්‍රකාශයක් අනුව එකී පොලිස් පරීක්ෂක විල්ලවආරච්චි යන අය අත්අඩංගුවට ගෙන කොළඹ මහේස්ත්‍රාත් අධිකරණ නඩු අංක බී 3250/14 යටතේ කරුණු වාර්තා කර ඇත.

04. එකී විල්ලවආරච්චි යන අය විසින් කරන ලද හෙළිදරව්වක් මත යැයි කියනු ලබන කරුණු අනුව රනිස්වල, කලගෙඩිහේන පදිංචිව සිටි දිලිප් අසංග නැලිගම යන තැනැත්තෙකුගේ ප්‍රකාශ මත ඔහුගේ වත්තෙහි මඩුවක සඟවා තිබියදී මෙම නඩුවේ සැකකරුවන් දෙදෙනා සහ පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා, උප පොලිස් පරීක්ෂක ප්‍රේමතිලක යන අයවළුන් විසින් මෙම නඩුවට අදාල ගිනි අවි සහ පුපුරණ ද්‍රව්‍ය විශාල තොගයක් සොයාගෙන ඇති බවට එවකට එනම්, 2014 වර්ෂයේදී අධිකරණයට වාර්තා කර ඇත.

05. ඒ අනුව මොහොමඩ් සියාම් ඝාතනය කිරීමට අදාල නඩුව බී 3279/05/13 යටතේ පැවතියදී බී3250/14 දරණ වෙනත්

අධිකරණය ලේඛනාගාරය
09 DEC 2020
ගම්පහ.

නඩුවක් යටතේ මෙම ආයුධ සහ පුපුරණ ද්‍රව්‍ය අනාවරණය කර ගැනීමට අදාලව පොලිස් පරික්ෂක විල්ලවආරච්චි අත්අඩංගුවට ගනිමින් මෙම ඉල්ලුම් පත්‍රයට අදාල සැකකරුවන් දෙදෙනා ඇතුළු පොලිස් කණ්ඩායම කටයුතු කර ඇත.

06. ඉහත කී කාරණය හේතුකොටගෙන එකී පුපුරණ ද්‍රව්‍ය සහ ආයුධ තොගය පොලිස් පරික්ෂක විල්ලවආරච්චි යන අයගේ ප්‍රකාශයට අනුව පොලිස් කොස්තාපල් සමරපාල ඩයස් සහ පොලිස් කොස්තාපල් සමීර සුසන්ත යන අයවළුන්ගේද සහභාගීත්වයෙන් යුතුව වාස් ගුණවර්ධන යන අයගේ නිවසේ සිට නැලිගම නමැත්තාගේ ඉහත කී වත්තට රැගෙන ගොස් තැබීම පිළිබඳව කරුණු හෙළිදරව් වීම යැයි සඳහන් කරමින් නීතිපති තුමා වෙත ඉදිරිපත් කරන ලද උධෘත අනුව (2014 වර්ෂයේදී) එම නඩුවට තවදුරටත් සැකකරුවන් ලෙස සැකකරුවන් අටදෙනෙකු ඉදිරිපත් කර ඇත. ඔවුන් ඉහත කී වාස් ගුණවර්ධන යන අයගේ බිරිඳ සහ දරුවන් සහ තවත් අයවළුන් බව අදාල සටහන් අනුව පෙනී යයි.

07. එකී කරුණු ඉදිරිපත් කිරීම අනුව කොළඹ මහේස්ත්‍රාත් අධිකරණය විසින් තවදුරටත් <u>2015.03.04 වන දින</u> නියෝග කර ඇත්තේ මෙම පීඩාකාරී ආයුධ සහ පුපුරණ ද්‍රව්‍ය සම්බන්ධව පොලිස් පරීක්ෂක විල්ලවආරච්චි යන

මහාධිකරණය ලේඛනාගාරය
09 DEC 2020
ගම්පහ.

Scanned with CamScanner

අයගේ ප්‍රකාශයෙන් අනාවරණය වූවා යැයි කියනු ලබන පොලිස් කොස්තාපල් සමරපාල ඩයස්, පොලිස් කොස්තාපල් සමීර සුසන්ත සහ එකී අවි සහ පුපුරණ ද්‍රව්‍ය සඟවා තිබුණා යැයි කියනු ලබන ඒ වත්තෙහි මඩුවෙහි හිමිකරු වන නැලිගමගේ අසංග නැලිගම සහ ඔහුගේ බිරිඳ වන විරන්ති සංජීවනී යන අයවළුන්ද අත්අඩංගුවට ගෙන ඉදිරිපත් කරන ලෙසයි.

08. එකී මහේස්ත්‍රාත්වරයාගේ නියෝගය ගරු නීතිපති තුමා විසින් අභියෝගයට ලක්කොට ප්‍රතිශෝධනයක් කොළඹ මහාධිකරණයට ඉදිරිපත් කර ඇති අතර, එම ප්‍රතිශෝධන අයදුම් පත්‍රය කොළඹ මහාධිකරණය විසින් 2017.06.30 වන දින නිෂ්ප්‍රභා කර ඇත.

09. ඒ අනුව එවකට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ බලධාරියෙකු ලෙස කටයුතු කල මෙම ඇප ඉල්ලුම් පත්‍රයේ මෙම නඩුවේ පලමු සැකකරු වන ශානි අබේසේකර සහ ඊට අදාල නිලධාරීන්ගේ වගකීම වූයේ එකී කොළඹ මහේස්ත්‍රාත්වරයාගේ 2015.03.04 දින දරණ නියෝගය ප්‍රකාරව ඉහත කී අයවළුන් අත්අඩංගුවට ගෙන ඔවුන්ද නඩුවේ සැකකරුවන් ලෙස ඉදිරිපත් කිරීමයි. එහෙත් මහාධිකරණය විසින් ප්‍රතිශෝධනයෙන් අදාල මහේස්ත්‍රාත්වරයාගේ නියෝගය ඉවත නොදැමූ බැවින් එය බලාත්මකව පැවතුනද 2019.12.09 වන දින දක්වා එනම්

මහාධිකරණය මීගමුව
09 DEC 2020
ගම්පහ.

Scanned with CamScanner

වර්ෂ දෙකකුත් මාස 06කට ආසන්න කාලයක් වනතුරු එම මහේස්ත්‍රාත්වරයාගේ නියෝගය පරිදි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ඔවුන් අත්අඩංගුවට ගෙන ඉදිරිපත් නොකිරීම නිසා එම නියෝගය ක්‍රියාත්මක කරන ලෙස නීතිපතිවරයා 2019.12.09 වන දින උපදෙස් ලබාදී ඇත.

10. ඉහත කී නියෝගය අනුව අදාල අයවළුන් අත්අඩංගුවට ගෙන ඉදිරිපත් කර ඇති අතර, ඔවුන් විසින් දෙන ලද ප්‍රකාශ සහ අනෙකුත් විමර්ශන වාර්තා සළකා බලා එකී අයවළුන් 2020.06.11 වන දින නීතිපතිවරයාගේ උපදෙස් මත නිදහස් කර ඇත.

11. ඒ අනුව මෙහි විමර්ශන කටයුතු කොළඹ අපරාධ කොට්ඨාශය වෙත පවරා ඇති අතර, ඒ වන විට විශේෂයෙන් දිලිප් අසංග නැලිගම සහ චිරන්ති සංජීවනී, සමීර සුසන්ත යන අයවළුන්ගේ ප්‍රකාශ මත සහ හෙළිදරව් වූ කරුණු මත මෙම නඩුවට විෂයගත පුපුරණ ද්‍රව්‍ය සහ පීඩාකාරී ආයුධ මුලින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව අධිකරණයට වාර්තා කර ඇති පරිදි සත්‍ය වන්නේද, නැද්ද යන්න පිළිබඳව ප්‍රශ්නාර්ථයක් නිර්මාණය වී ඇත.

12. එකී හේතුව මත නැවත එකී අසංග නැලිගම, චිරන්ති සංජීවනී, සමීර සුසන්ත සහ සමරපාල ඩයස් යන අයවළුන් විසින් නැවත අපරාධ නඩු විධාන සංග්‍රහයේ 127(1) වගන්තිය යටතේ ගම්පහ මහේස්ත්‍රාත් අධිකරණයේදී

මහාධිකරණය ලේඛනාගාරය
09 DEC 2020
ගම්පහ.

Scanned with CamScanner

ප්‍රකාශ ලබාදී ඇත. එකී ප්‍රකාශවල අන්තර්ගතයට අනුව එම මෙම නඩුවට විෂයගත පුපුරණ ද්‍රව්‍ය සහ පීඩාකාරී ආයුධ එකී හිටපු නියෝජ්‍ය පොලිස්පති වාස් ගුණවර්ධනගේ නිවසේ තිබී රැගෙන යාම නොව, මෙම ඇප ඉල්ලුම් පත්‍රයට අදාල පලමු සැකකරු ලෙස ශානි අබේසේකර යන අයගේ මූලිකත්වයෙන් පොලිස් පරීක්ෂක විල්ලවආරච්චි නමැත්තාට කරන ලද බලපෑම මත අසංග නැලිගම යන අයගේ කලගෙඩිහේන පිහිටි වත්තට වාහනයකින් මෙම ආයුධ ගෙන ගොස් දමා, ඒවා ඡායාරූප ගතකොට මෙලෙස අසත්‍ය ලෙස හඳුන්වාදීමක් සිදුකරන ලද බවට එම ප්‍රකාශ වලින් කරුණු වාර්තා වී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස මෙම නඩුවට අදාලව ශානි අබේසේකර පලමුවන සැකකරු ලෙස 2020.07.31 වන දිනත්, සුගත් මෙන්ඩිස් දෙවන සැකකරු ලෙස 2020.08.04 වන දිනත් මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව රිමාන්ඩ් භාරයට පත්වී ඇත.

ඉහත කෙටියෙන් විස්තර කරන ලද පසුබිම තුල කොළඹ මහේස්ත්‍රාත් අධිකරණ නඩු අංක බී 3250/14 දරණ නඩුවට ඉදිරිපත් කොට වාර්තාගත කර ඇති එකී පුපුරණ ද්‍රව්‍ය සහ ආයුධ සත්‍ය ලෙසින්ම වාස් ගුණවර්ධන සන්තකයේ තිබී රැගෙන පොලිස් පරීක්ෂක විල්ලවආරච්චි විසින් රැගෙන ගොස් අසංග නැලිගම යන අයගේ කලගෙඩිහේන වත්තේ මඩුවේ සඟවා තැබුවේද, නොඑසේ නම් පොලිස් පරීක්ෂක විල්ලවආරච්චි සහ අසංග නැලිගම සහ ඔහුගේ බිරිඳ විසින්

09 DEC 2020

Scanned with CamScanner

ප්‍රකාශ කරන ලද පරිදි ශානි අබේසේකර සහ අනෙකුත් ඔහුගේ නිලධාරීන් විසින් වෑන් රථයකින් එම ආයුධ කලගෙඩිහේනට රැගෙන ගොස් එලෙස මඩුවක තබා ඡායාරූප ගත කලේද යන කරුණු ද්විත්වය අතර දැඩි සහ බරපතල විශාල ගැටළුවක් නිර්මාණය වී ඇත.

පොලිස් පරීක්ෂක විල්ලවආරච්චි සහ අනෙකුත් පොලිස් නිලධාරීන් විශේෂයෙන් සුසන්ත සහ ඩයස් යන අයවළුල් පසුව අනාවරණය කර ඇත්තේ ඔවුන්ගේ රැකියාව සහ ජීවිතය එමෙන්ම අනාගතය පිළිබඳව දැඩි බලපෑම් එල්ල වූ බැවින් ඔවුන් මුලින් අසත්‍ය ප්‍රකාශ කොට වර්තමානයේ සත්‍ය ප්‍රකාශ කරන බවයි. ඒ අනුව මෙම ආයුධ ශානි අබේසේකර ඇතුළු නිලධාරීන් කණ්ඩායම විසින් ගෙන ආ බවයි.

ඉහත කී පදනම මත මෙම නඩුවට ශානි අබේසේකර සහ ඔහු සමඟ කණ්ඩායමේ සේවය කල සුගත් මෙන්ඩිස් යන නිලධාරියා සැකකරුවන් ලෙස මෙම නඩුවේ ඉදිරිපත් කොට ඔවුන්ට එරෙහිව බොරු සාක්ෂි සෑදීම සහ පීඩාකාරී ආයුධ සහ පුපුරණ ද්‍රව්‍ය සන්තකයේ තිබීම පිළිබඳව චෝදනා මත තවදුරටත් ඉදිරි විමර්ශන කටයුතු පවත්වන බවට වාර්තා වේ.

පලමු සැකකාර ශානි අබේසේකර වෙනුවෙන් වාචික දේශන දීර්ඝ ලෙස ඉදිරිපත් කරමින් කරුණු ගණනාවක් සඳහන් කොට ඇප ලබාදෙන ලෙස ඉල්ලා ඇත. දෙවන සැකකරු වෙනුවෙන්ද වාචික දේශන ඉදිරිපත් කොට කරුණු ගණනාවක් මත ඇප අයදීමක් සිදුකර ඇත.

මහාධිකරණය ලේඛනාගාරය
09 DEC 2020
ගම්පහ.

Scanned with CamScanner

සැකකරුවන්ට එරෙහිව පදනම් කරන ලද චෝදනාවල ස්වභාවය අනුව ඇප ලබාදීම සළකා බැලීමේදී විශේෂයෙන් පීඩාකාරී ආයුධ පනතේ සහ තුවක්කු ආඥා පනතේ ප්‍රතිපාදන වලට අනුව ඇප සළකා බැලීම මෙම අධිකරණය විසින් සිදු කළයුතු වන්නේ ඇප පනතේ 14 වගන්තිය යටතේ බව නිශ්චිත කරුණකි. ඒ අනුව මෙම අවස්ථාව වන විට සැකකරුවන්ට ඇප ලබාදිය යුතුද නැද්ද යන්න තීරණය කළයුතු වන්නේ ඇප පනතේ 14 වන වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව ඔවුන්ට ඇප ලබාගැනීමට සුදුසුකම් පවතීද යන්න මතයි. ඇප පනතේ මූලික රීතිය ඇප ලබාදීම වන අතර, ඇප ප්‍රතික්ෂේප කිරීම ව්‍යතිරේඛයක් වේ. ඇප ප්‍රතික්ෂේප කිරීමට නම් අදාල ප්‍රතිපාදන වලට අනුව කරුණු තිබිය යුතුය. ඒ අනුව සැකකරුවන් වෙනුවෙන් ඉදිරිපත් කරන ලද කරුණු මොනවාද, ඒවා ඇප පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව ඇප ලබාදීමට සුදුසුකම් ඇති කරුණුද, නොඑසේ නම් ඇප ප්‍රතික්ෂේප කිරීමට පදනම් වන කරුණුද යන්න මීලඟට මා සළකා බලමි.

විශේෂයෙන් පලමුවන සැකකාර ශානි අබේසේකර වෙනුවෙන් දක්වන ලද කරුණු අතර බොහෝ කරුණු රාශියක් ඉදිරිපත් කරන ලද්දේ මෙම නඩුවට පදනම් වූ සිද්ධිමය කාරණා පිළිබඳවයි. දීර්ඝ ලෙස එකී සිද්ධිමය කාරණා පිළිබඳව නීතිඥ මහතා කරුණු දක්වා ඇති අතර, එම සියළුම කරුණුවල මූලික හරය ලෙස ඉදිරිපත් කර ඇත්තේ මෙම ප්‍රශ්නගත ආයුධ පිළිබඳව <u>සන්තකය</u> කිසි විටක ශානි අබේසේකර සැකකරු වෙත නොතිබූ බවයි. එවැනි සන්තකය තහවුරු කරන්නා වූ කිසිදු සිද්ධිමය කරුණක් මෙම නඩුවේ නොමැති බවයි. ඒ අනුව ඉදිරිපත්

09 DEC 2020
ගම්පහ.

Scanned with CamScanner

වූ සියළුම කරුණු එම පලමුවන සැකකරුට විරුද්ධව අසත්‍ය ලෙස නිර්මාණය වී ඇති කරුණු බවත් සැළකර ඇත.

එම සිද්ධිමය කරුණු පිළිබඳව සඳහන් කළයුතු වන්නේ ඒවා ප්‍රධාන නඩු විභාගයේදී එහි ඇති සත්‍ය අසත්‍යතාවය ගැඹුරින් නඩු විභාගයට භාජනය වීමෙන් පසුව තීරණය කළයුතු කරුණු බවයි. ඕනෑම නඩුවක පවතින සිද්ධිමය කරුණු සම්බන්ධයෙන් ඇප සළකා බලන අවස්ථාවේදී විශ්ලේෂණය කොට තීරණය කිරීමට නොහැකිය. එය නීතියට අනුකූල නැත. ඒ අනුව මෙම නඩුවේ සැකකරුවන් දෙදෙනාම වෙනුවෙන් යම් සිද්ධිමය කරුණු පිළිබඳව මෙම අධිකරණයට ඉදිරිපත් කර ඇත්තේ නම් ඒ සියළුම කරුණු සත්‍යද, අසත්‍යද යන්න නිගමනය කිරීමට මෙම අධිකරණය බලාපොරොත්තු වන්නේ නැත. මෙම අධිකරණය කටයුතු කරන්නේ ඉදිරිපත් වී ඇති විමර්ශනවලට අදාල කාරණා සහ වරදේ ස්වභාවය සහ ඇප ලබාදීමට නීතියට අනුකූලව පවතින කරුණු මොනවාද යන්න පමණි. එසේ හෙයින් පලමුවන සැකකරු සම්බන්ධයෙන් දීර්ඝ ලෙස සිද්ධිමය කරුණු පිළිබඳව දක්වන්නට යෙදුණු කාරණා මා නැවත විශ්ලේෂණය කිරීමට බලාපොරොත්තු වන්නේ නැත.

ඇප ලබාගැනීම සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද අනෙකුත් කාරණා අතර පලමුවන සැකකරු සම්බන්ධයෙන් ඇප සළකා බැලීමේදී පහත සඳහන් කරුණු සැළකිල්ලට ගන්නා ලෙසට මෙම අධිකරණයේ අවධානය ලක්කර ඇත.

මහාධිකරණය ලේඛනාගාරය
09 DEC 2020
ගම්පහ.

Scanned with CamScanner

01. පලමුවන සැකකාර ශානි අබේසේකර වාර 30 ගණනකට වඩා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට භාරවී මුහුණ දුන් බව. ඔහු ස්ථාන මාරු කිරීමෙන් පසුව ශ්‍රේෂ්ඨාධිකරණයට ගොස් ස්ථාන මාරුවට එරෙහිව නඩු දැමූ බව. ඒ අනුව ඔහු කිසි විටෙක අධිකරණයෙන් පලා යන තැනැත්තෙකු නොවන බව.

02. පැමිණිල්ලෙන් විමර්ශනවලට අනුව කියා සිටින පරිදි යැයි සඳහන් කරමින් නිශාන්ත සිල්වා නමැති අනෙක් නිලධාරියා මේ වන විට දිවයිනෙන් පැන ගොස් ඇති බැවින් ඔහු අත්අඩංගුවට ගැනීමට ඇති බවට විමර්ශන නිලධාරීන් සඳහන් කරන බැවින් ඔහු අත්අඩංගුවට ගන්නා තෙක් පලමුවන සැකකරු රිමාන්ඩ් භාරයේ සිටීම නොයුතු බවයි.

03. පලමුවන සැකකාර ශානි අබේසේකර යන අය දරුණු දියවැඩියා රෝගයෙන් සහ අධික රුධිර පීඩනයෙන් පෙළෙන බැවින් සහ රටේ පවතින වසංගත තත්ත්වයද සැළකිල්ලට ගැනීමේදී ඔහු රිමාන්ඩ් භාරයේ තැබීම නොකල යුතු බවට යන කාරණා වේ.

04. පෙර වැරදි හෝ චෝදනා නැති බව.

මෙම කාරණාවලට එරෙහිව ඇප ඉල්ලීමට දැඩිව විරෝධය පලකරමින් නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල්වරයා සඳහන් කරන්නේ පහත කරුණුය.

අධිකරණ ලේඛනාගාරය
09 DEC 2020
ගම්පහ.

Scanned with CamScanner

01. වාස් ගුණවර්ධනට අදාල මිනී මැරුම් නඩුවට සහ මෙම අවි ආයුධ සම්බන්ධයෙන් නඩුවට ලිපි ගොණු දෙකක් නීතිපති දෙපාර්තමේන්තුවේ පැවති බව.

02. 2014 වර්ෂයේ අනාවරණය වූ මෙම ආයුධ සම්බන්ධයෙන් මෙපමණ කලක් ගත වූයේ මන්ද යන ප්‍රශ්න කිරීම හේතුවෙන් නීතිපති දෙපාර්තමේන්තුව වෙනුවෙන් සඳහන් කරන්නේ 2019 වර්ෂයේ නීතිපතිවරයා විසින් දෙන ලද නියෝගය අනුව මහේස්ත්‍රාත් අධිකරණයේ 2015 වර්ෂයේදී දෙන ලද නියෝගය ක්‍රියාත්මක කිරීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව කටයුතු නොකිරීම නිසා මෙම තත්ත්වය නිර්මාණය වූ බවයි. එනම් 2015 වර්ෂයේ මහේස්ත්‍රාත්වරයා දෙන ලද තීරණය 2017 වර්ෂයේ ප්‍රතිශෝධන අයදුම් පත්‍රය ප්‍රතික්ෂේප වීමෙන් පසුව වුවද අදාල පුද්ගලයින් අත්අඩංගුවට ගැනීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ එවකට කටයුතු කල පලමුවන සැකකරු කටයුතු නොකිරීම නිසා එය පැහැර හැරීම හේතුවෙන් මෙලෙස වසර ගණනාවක් ගතවී ඇති බව.

03. මෙකී කාරණය මා ඉහත මෙම නඩුවට පාදක වූ මූලික කරුණුවල පසුබිම විස්තර කිරීමේදී පැහැදිලි කර ඇත. ඒ අනුව එකී ප්‍රමාදය පිළිබඳව පලමුවන සැකකරු වෙනුවෙන් ඉදිරිපත් කරන විරෝධය සහ දෝෂදර්ශනය යුක්ති සහගත නැත.

ලේඛනාගාරය
නොධිකරණය
09 DEC 2020
ගම්පහ.

Scanned with CamScanner

04. සාක්ෂිකරුවන්ට බලපෑම් කර ඇති බවට දැනටමත් මහේස්ත්‍රාත් අධිකරණයේද ප්‍රකාශ ලබා දී ඇති පදනමක් මත ඇප මත නිදහස් කිරීම නුසුදුසු බව.

05. මෙම සිදුවීමට අදාල විමර්ශන පිළිබඳව ප්‍රතිඵලය මෙතෙක් නීතිපති දෙපාර්තමේන්තුවට ඉදිරිපත් වී නැති බවට සහ විමර්ශන සිදුකොට කොටසින් කොටස නොව, සම්පූර්ණ විමර්ශනයකින් පසුව උධෘත නීතිපති දෙපාර්තමේන්තුව වෙත එන බැවින් මෙතෙක් එවැනි විමර්ශනයක් අවසන් කොට පූර්ණ වාර්තාවක් ලෙසට විමර්ශන වාර්තා ලැබී නැති බැවින් නිසි තීරණයක් හෝ අදාල කරුණු දැක්වීමට තවමත් නිශ්චිතතාවයකට පත්කර ගැනීමට නොහැකි වී ඇති බව.

06. විශේෂයෙන් මෙම නඩුවේ සිද්ධියට අදාලව සාක්ෂිකරුවන් අසත්‍ය කියන්නේද, සත්‍ය කියන්නේද යන්න මේ වන විට ඉදිරිපත් වූ විමර්ශන අනුව නිශ්චය කළ නොහැකි බව.

07. ඒ අනුව තවදුරටත් එම සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශ පදනම් කරගෙන විමර්ශන පවත්වා ගෙන යන බව.

08. මෙම නඩුවේ මූලික පදනම ම බොරු සාක්ෂි සෑදීම වන බව.

09. මෙම නඩුවට විෂයගත ආයුධ සහ පුපුරණ ද්‍රව්‍ය නිශ්චිතවම කාගේ භාරයේ සහ සන්තකයේ පැවතියේද යන්න නිශ්චය කර ගැනීමට තවමත් විමර්ශනය කරමින් සිටින බව.

0 9 DEC 2020
ගම්පහ.

Scanned with CamScanner

10. මෙම නඩුවට අදාල තවත් ප්‍රධාන සැකකරුවෙකු වන නිශාන්ත සිල්වා නමැති අය මේ වන විට රටින් පලා ගොස් ඇති බව සහ ඔහුද අත්අඩංගුවට ගෙන ඉදිරි කටයුතු කිරීමට ඇති බව.

11. මේ වන විට විමර්ශන ඒකකයේ නිලධාරීන් 55 දෙනෙකුට පමණ කොවිඩ් ආසාධනය වී එම අංශයේ කටයුතු අඩාල වීමට බලපා අති බව.

12. මෙම අපරාධයට අදාල ආරම්භය 2013 වර්ෂය සහ 2014 වර්ෂය දක්වා දිවෙන බැවින් මෙම සිදුවූ ක්‍රියාවන් සම්බන්ධව දූරකථන සහ කුළුණු වාර්තා සහ විශ්ලේෂණ වාර්තා ලබා ගැනීමට ඇති බව.

13. ඒ අනුව මෙම ගිනි අවි කෙලෙස සපයා ගත්තාද යන්න පිළිබඳව විමර්ශනය කොට අනාවරණය කර ගැනීමට තවදුරටත් සාධාරණ කාලයක් අවශ්‍ය බව.

14. සාක්ෂිකරුවන් පස්දෙනෙක් පමණ මේ වන විට මහේස්ත්‍රාත් අධිකරණයට ප්‍රකාශ ලබාදී ඇති බැවින් ඒ පිළිබඳව තවදුරටත් විමර්ශනය කලයුතු බව.

මීලඟට මා දෙවන සැකකරු වන සුගත් මෙන්ඩිස් යන අය වෙනුවෙන් ඇප ඉල්ලා සිටිමින් ඉදිරිපත් කරන ලද කරුණු සම්බන්ධයෙන් පහත පරිදි සටහන් කරමි.

මහාධිකරණය ලේඛනාගාරය
09 DEC 2020
ගම්පහ.

Scanned with CamScanner

දෙවන සැකකරු සම්බන්ධයෙන් එනම් ඇප අයදුම් පත් අංක 374/2020ට අදාල සැකකරු සම්බන්ධයෙන් මෙම අධිකරණය ඔහුට ඇප ලබා දිය යුතු බවට පහත සඳහන් කරුණු කෙරෙහි අධිකරණයේ අවධානය යොමු කරන ලදී.

01. දෙවන සැකකරු ඇඹිලිපිටිය පොලිස් ස්ථානය වැනි දුර ප්‍රදේශයක රාජකාරී කරමින් සිටියදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණීමට ඔහුට දැන්වීමෙන් පසුව ඔහු රක්ෂිත බන්ධනාගාර ගතවන බව දනිමින්ම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ඉදිරිපත් වී ඇති බව සහ ඒ අනුව ඔහු කිසිදු විටක පැන යාමට නැඹුරුතාවයක් දරණ සැකකරුවෙකු නොවන බව.

02. ඇප ලබාදීම සම්බන්ධයෙන් ඇප පනතේ 14 වන වගන්තියට අදාලව කරුණු සළකා බැලිය යුතු බැවින් ඇප ප්‍රතික්ෂේප කිරීමට අදාලව කිසිදු කාරණයක් දෙවන සැකකරු සම්බන්ධයෙන් නොපවතින බව.

03. ඒ අනුව ඇප පනතේ 14 වන වගන්තියේ ඇප ප්‍රතික්ෂේප කිරීමට අදාල පලමු කාරණය වන නඩු විභාගයට අධිකරණය වෙත නොපැමිණිය හැකි යැයි සිතීමට කිසිදු හේතුවක් නොමැති බැවින් එකී කාරණය දෙවන සැකකරුට අදාල නොවන බව.

09 DEC 2020
ගම්පහ.

Scanned with CamScanner

04. දෙවන සැකකරුගෙන් කිසිදු විටක සාක්ෂිකරුවන්ට බලපෑම් සිදුවී නැති බැවින් ඇප පනතේ 14(1) අ (ii) වගන්තිය යටතේද ඔහුට එරෙහිව කරුණු නොපවතින බව.

05. එමෙන්ම ඇප පනතේ 14(1) අ (iii) වගන්තිය ප්‍රකාරව ඇප පිට සිටියදී කිසිදු වරදක් කිරීමට ඉඩ ඇති බව යන කාරණයද ඔහුට අදාල නොවන බව.

06. එමෙන්ම ඇප පනතේ 14(1) (ආ) වගන්තිය ප්‍රකාරව මෙම සැකකරුට ඇප ලබාදීමෙන් කිසිදු මහජන කැලඹීමක් හෝ උද්සෝෂණයක් සිදුවීමට ඉඩක් නොමැති බව.

07. එමෙන්ම පොලිස් පරීක්ෂක විල්ලවආරච්චි නමැත්තාගෙන් නැවත ප්‍රකාශයක් ලබාගැනීමට ඇති බවට සහ හඬපට නැවත ලබා ගැනීමට ඇති බවට මෙන්ම දූරකථන වාර්තා ලබා ගැනීමට ඇති බවට පැමිණිල්ලෙන් කර ඇති සඳහන් කිරීම කිසිවිටක එම කාරණා පැමිණිල්ලට සිදු කිරීමට මෙම සාක්ෂිකරුගෙන් බාධාවක් නොවන බවට සහ එය ඇප ප්‍රතික්ෂේප කිරීමට හේතුවක් නොවන බව යන කාරණා ඉදිරිපත් කර ඇත.

එමෙන්ම දෙවන සැකකරු වෙනුවෙන් මහජන උද්සෝෂණ සහ කැලඹීමක් සිදුවීමට ඉඩ තිබූ පසුබිමක් නිර්මාණය වූ සිසිලියා

මහාධිකරණය රෙජිස්ට්‍රාර්
09 DEC 2020
ගම්පහ.

Scanned with CamScanner

කොතලාවල නඩුවේදී වුවද (ගෝල්ඩන් කී නඩුව) අභියාචනාධිකරණය ඇප ලබාදී තිබීම යන කාරණය අධිකරණය මෙහිදී සළකා බැලිය යුතු බව.

එමෙන්ම X-2 ලෙස ළමාහේවගේ එමිල් රංජන් යන නඩු තීන්දුව ඉදිරිපත් කරමින් දෙවන සැකකරු සම්බන්ධයෙන් ඇප ලබාදීමට අධිකරණය සළකා බැලිය යුතු බව.

එකී ළමාහේවගේ එමිල් රංජන් යන නඩු තීන්දුව ඇප පනතේ ප්‍රතිපාදනවලට අනුව අවුරුද්දකට පසුව බන්ධනාගාරගත කිරීම දීර්ඝ කිරීමට ඇප පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව නීතිපතිවරයා විසින් ඉල්ලීමක් කර නොතිබූ පසුබිමක් තුල ඇප ලබාදීම සළකා බලා ඇති නඩුවකි. ඒ අනුව එකී එමිල් රංජන් නඩු තීන්දුවේ අදාලත්වයක් මෙම නඩුව සම්බන්ධයෙන් සළකා බැලීමට නොහැකි බව සඳහන් කරමි.

එමෙන්ම පලමු සැකකරු වෙනුවෙන් මෙම අධිකරණයේ අවධානය නඩු තීන්දු දෙකක් කෙරෙහි ලක්කර ඇත. පලමු නඩු තීන්දුව වන්නේ රොසලින් එදිරිව සුන්දරලිංගම් සහ තවත් අය යන නඩු තීන්දුවයි. එය හබෙයාස් කෝපුස් රිට් ආඥාවක් සම්බන්ධයෙන් නඩුවකදී නැවත විවාදයට ලැයිස්තුගත කිරීම සඳහා විවාදයට භාජනය වූ කාරණාවකි. එහිදී පුද්ගලයෙකුට කල නොහැකි දෙයක් නීතිය ඉටු කිරීමට බලාපොරොත්තු නොවන්නේය යන සිද්ධාන්තයට මෙම අධිකරණයේ අවධානයට යොමු කර ඇත. ඒ අනුව එකී කාරණයද පලමු සැකකරු

මහාධිකරණය ලේඛනාගාරය
09 DEC 2020
ගම්පහ.

Scanned with CamScanner

වෙනුවෙන් ඇප ලබාදීමේදී අදාල කර ගැනීමට නොහැකි බව සඳහන් කළයුතුය.

තවදුරටත් පලමු සැකකරු වෙනුවෙන් <u>වික්‍රමසිංහ එදිරිව නීතිපති</u> සහ තවත් අය නඩු තීන්දුව කෙරෙහි අධිකරණයේ අවධානය යොමු කර ඇත. එහිදී ඇප පනතේ මූලික රීතිය ඇප ලබාදීම යන්න සළකා බලා ඇති බවටත්, ඒ අනුව ඇප සළකා බැලීමක් සිදු කළයුතු බවටත් තර්ක කර ඇත.

එම නඩුවේදී චූදිත මිනී මැරුම් චෝදනාවක් සඳහා වසර තුනකුත් මාස පහක් රක්ෂිත බන්ධනාගාරගතවී තිබූ නඩුවකි. එහිදී ඇප පනතේ 16 සහ 17 වගන්තියට අදාල කාරණා එනම් වසරකින් පසුව තවත් වසරක් රක්ෂිත බන්ධනාගාර ගත කිරීම සඳහා නීතිපති වරයා විසින් ඉල්ලීමක් සිදු කළයුතු බව සහ ඒ අනුව වසර දෙකක උපරිමයකට වඩා ඇප පනත යටතේ වුවද කිසිදු පුද්ගලයෙකු රක්ෂිත බන්ධනාගාරයේ නොතැබිය යුතු බවටත්, එහිදී ඇප පනතේ 16 සහ 17 වගන්ති ඇප පනතේ 14 වගන්තියට යටත් නොවන බවටත් තීරණය කර ඇති නඩුවකි. ඒ අනුව එකී නඩුවේ අදාල කරුණුද මෙම නඩුවට අදාල කර ගැනීමට අදාලත්වයක් නොමැති බව සඳහන් කළයුතුය.

කෙසේ හෝ මෙම අධිකරණය විසින් ඇප පනතේ 14 වන වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව ඇප ප්‍රතික්ෂේප කිරීමට සැකකරුවන් සම්බන්ධයෙන් හේතු ඇත්ද යන්න සහ ඇප ලබාදීම රීතියක් වීම සහ ඇප

මහාධිකරණය ලේඛනාගාරය
09 DEC 2020
ගම්පහ.

Scanned with CamScanner

ප්‍රතික්ෂේප කිරීම ව්‍යතිරේඛයක් යන කාරණා නිතැතින්ම අධිකරණ මනසේ රඳවා සිටින බව සඳහන් කළයුතුය.

තවදුරටත් ගරු නීතිපති තුමා වෙනුවෙන් මෙම අධිකරණයේ ඇප සම්බන්ධයෙන් විරෝධතා ඉදිරිපත් කරමින් ඇප පනතේ ප්‍රතිපාදන සැළකිල්ලට ගන්නා ලද විනිශ්චිත නඩු තීන්දු කිහිපයක් කෙරෙහි අධිකරණයේ අවධානය යොමු කරන ලදී. ඒ අතරින් පහත කරුණු මා සටහන් කරමි.

අනුරුද්ධ රත්වත්තේ සහ තවත් අය එදිරිව නීතිපති නඩුවේ කරුණු සැළකිල්ලට ගන්නා ලෙසට සඳහන් කර ඇත. මෙම නඩුව ත්‍රිපුද්ගල විනිශ්චාසන නඩුවක නඩු විභාගය පටන් ගන්න අවස්ථාවේදී ඇප වලට නීතිපතිවරයා විරුද්ධ නොවී ඇති අවස්ථාවක මහාධිකරණ විනිසුරුවරයා චූදිතයින් බන්ධනාගාරගත කිරීමේ නියෝගයට එරෙහිව ගෙන ආ නඩුවකි. එහිදී එලෙස චූදිතයින් රිමාන්ඩ් භාරයට පත්කිරීම පිළිබඳව මහාධිකරණ විනිසුරු තුමා හේතුද ලබාදී නැත. ඒ අනුව ඇප පනතේ 14 වගන්තිය ප්‍රකාරව ඇප ප්‍රතික්ෂේප කිරීමකදී හේතු විනිසුරුවරයා ලබාදිය යුතු බවට යන කරුණු සහ ඇප පනතේ බලපෑම පිළිබඳව විශ්ලේෂණය කර ඇති නඩුවකි. කෙසේ හෝ එම නඩුවේ සිද්ධිමය කාරණා මෙම නඩුවට ඍජු ලෙස අදාල නොවන කරුණු බවට සඳහන් කරමි. තවදුරටත් වැල්විට ආරච්චිගේ චන්ද්‍රිකා ජයතුංග එදිරිව නීතිපති අභියාචනාධිකරණ නඩු අංක 58/201 නඩු තීන්දුව අධිකරණයේ අවධානයට ලක්කර ඇත.

මහාධිකරණ ලේඛනාගාරය
09 DEC 2020
ගම්පහ.

Scanned with CamScanner

මෙම නඩුවේදී මෝෂන් පත්‍රයක් මඟින් සැකකරුවෙකුට ඇප ලබාදී ඇති විට ඇප කොන්දේසි ලිහිල් කර ගැනීමට කරන ලද ඉල්ලීමකදී ඇප වාර්තාවක් කැඳවීමේදී පොලිසියට වාර්තා කිරීමේ ඇප කොන්දේසිය උල්ලංඝනය කර ඇති බවට වාර්තා කර ඇති බැවින් මහාධිකරණ විනිසුරුවරයා ඇප අවලංගු කොට රක්ෂිත බන්ධනාගාර ගත කර ඇති නඩුවකි. එම නියෝගය සිදුකර ඇත්තේ චූදිතට ඇප ලබාදී අවුරුදු හතරහමාරකටත් පසුවය. එහිදී ඇප නියෝගයක් අවලංගු කිරීමේදී ඇප පනතේ 14 වගන්තිය හා ඊට අදාලව පවතින වෙනත් ප්‍රතිපාදන කෙසේ සළකා බැලිය යුතුද යන්න විග්‍රහ කරන ලද නඩුවකි. ඒ අනුව උගත් මහාධිකරණ විනිසුරු තුමා ඇප අවලංගු කිරීමේ තීරණය ඉවත දමා ඇප මත මුදා හැරීමට නියෝග කර ඇති නඩුවක් වේ. එහිදී සිද්ධිමය කාරණාද මෙම නඩුවට අදාලව බලපවත්නෝ නැති බව මගේ නිගමනයයි.

තවදුරටත් <u>ජොන්ස්ටන් ප්‍රනාන්දු එදිරිව නීතිපති</u> දරණ නඩු තීන්දුව කෙරෙහි අධිකරණයේ අවධානය යොමුකර ඇත. මෙම නඩුවේදී අධිචෝදනා පත්‍ර භාරදීමෙන් පසු විභාගය දිනපතා ආරම්භ කිරීම සිදුකරන ලද අවස්ථාවේදී චූදිත රිමාන්ඩ් භාරයට පත්කරන ලද නඩුවකි. එහිදී එලෙස චූදිතයෙක් සම්බන්ධයෙන් කටයුතු කිරීමට ඇති මහාධිකරණ විනිසුරුවරයාගේ බලය පිළිබඳව සහ ඊට අදාලව ඇප පනතේ ප්‍රතිපාදන කෙලෙසක අදාල විය යුතුද යන්න සාකච්ඡා කරන ලද නඩුවකි. ඒ අනුව එකී නඩුවේ සිද්ධිමය කරුණුද මෙම අධිකරණයේ ඇප සම්බන්ධයෙන්

මහාධිකරණය ලේඛනාගාරය ගම්පහ. 09 DEC 2020

Scanned with CamScanner

විනිශ්චයට භාජනය කරන ලද සැකකරුවන්ට අදාලව අදාල කර ගත හැකි තත්ත්වයෙන් නඩුවක් නොවන බව සඳහන් කළයුතුය.

කෙසේ හෝ එම නඩු සියල්ලගේම ඇප පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව අධිකරණය කටයුතු කලයුතු බවට වන විශ්ලේෂණය සහ නිගමනය මෙම අධිකරණය ඉතා සුපරික්ෂාකාරිව සැළකිල්ලට ගන්නා බව සඳහන් කළයුතුය.

ගරු නීතිපතිවරයා වෙනුවෙන් ඇප සම්බන්ධයෙන් විරෝධතා ඉදිරිපත් කරමින් මෙම අධිකරණයට ඉදිරිපත් කර ඇති ඇප විරෝධතා වාර්තාවේ සඳහන් කරුණු මොනවාද යන්න මා සළකා බලමි. ඒ අනුව ඇප විරෝධතා වාර්තාව ඉතා දීර්ඝ ලෙස කරුණු සඳහන් කර ඇති අතර, විරෝධතාවයට පදනම් වන කරුණු ලෙස ඉදිරිපත් කර ඇති සමස්ථ කරුණුවල සංක්ෂිප්තයක් මා පහත නැවත ලියා දක්වමි.

01. තවදුරටත් සාක්ෂිකරුවන්ගෙන් ප්‍රකාශ සටහන් කර ගැනීමට ඇති බව.

02. තවත් සැකකරුවෙකු වන හේවාදේවගේ නවරත්න ප්‍රේමතිලක යන අයගේ ප්‍රකාශ සටහන් කර ගැනීමට ඇති බව සහ ඔහුට සියාම් ඝාතන නඩුවේ උධෘත පරිශීලනය කිරීමට අවශ්‍ය බව සහ ඉන්පසුව ප්‍රකාශයක් ලබා දෙන බවට ඉල්ලීමක් කර ඇති බැවින් ඒ අනුව මහේස්ත්‍රාත් අධිකරණයේ නියෝග ලබාගෙන ඒ අනුව කටයුතු කිරීමට ඇති බව.

09 DEC 2020

Scanned with CamScanner

03. ගිනි අවි සහ පීඩාකාරී ආයුධ සැකකරුවන්ට ලැබුනේ කෙසේද යන්න අනාවරණය කර ගැනීම සඳහා තවදුරටත් ප්‍රකාශ සහ විමර්ශන සිදු කිරීමට ඇති බව.

04. සමස්ථ විමර්ශනයට අදාලව දුරකථන වාර්තා ලබා ගැනීමට සහ ඒ අනුව තවදුරටත් විමර්ශනය කිරීමට ඇති බව.

05. සැකකරුවන් ඉහල තනතුරු දැරූ අය බැවින් පැමිණිලිකරුවන් සාමාන්‍ය පුද්ගලයින් සහ සාක්ෂිකරුවන් පහල නිලධාරීන් බැවින් ඔවුනට බලපෑම් කිරීමට ඉඩ ඇති බව.

06. පොලිස් පරික්ෂක නිශාන්ත සිල්වා මෙම අධිකරණය මඟ හැරීමට ඉඩ ඇති බව සහ විමර්ශන සිදු කිරීමට එමගින් බාධාවක් වියහැකි බව.

ඉහත සඳහන් කරුණු ඇප සම්බන්ධයෙන් විරුද්ධ වෙමින් ගරු නීතිපති තුමා වෙනුවෙන් ඉදිරිපත් කර ඇති අතර, විශේෂයෙන් ගරු නීතිපති තුමා වෙනුවෙන් ඇප විරෝධතාවය ඉදිරිපත් කිරීමේදීද තදබල ලෙස අවධාරණය කර ඇත්තේ තවදුරටත් විමර්ශන කටයුතු අවසන් කර නොතිබීමත්, සාක්ෂිකරුවන් සහ විමර්ශන කටයුතු වලට බලපෑම් සිදුකිරීමට බොහෝ විට ඉඩ තිබීම සහ සමස්ථ නඩුවේ පදනම ම සාක්ෂිකරුවන්ට බලපෑම යන්න බවයි. ඒ අනුව එකී කාරණය කෙරෙහි මෙම අධිකරණයේ අවධානය ලක්කල යුතු බව මගේ නිගමනයයි.

මහාධිකරණය ලේඛනාගාරය
09 DEC 2020
ගම්පහ.

Scanned with CamScanner

විරෝධතා වාර්තාවේ සඳහන් කරුණු අතරින් මා විසින් ඉහත කෙටියෙන් විස්තර කරන ලද ඡේදයන් අතරින් අංක 03 සහ අංක 05 දරණ ඡේදවල සඳහන් කරුණු කෙරෙහි නිතැතින්ම අවධානයට යොමු කලයුතු බව මගේ නිගමනයයි.

ඒ අනුව සැකකරුවන් දෙදෙනාටම අදාලව මෙම අධිකරණය ඉදිරියේ ඉදිරිපත් වී ඇති කරුණු අනුව ඔවුන්ට ඇප ලබාදීම සුදුසුද, ඇප ප්‍රතික්ෂේප කලයුතුද යන්න සළකා බැලීමේදී තවදුරටත් මා පහත සඳහන් කරුණු සැළකිල්ලට සහ විශ්ලේෂණයට ලක් කරමි.

පලමුවන සැකකරුගේ සෞඛ්‍ය තත්ත්වය පිළිබඳව මෙම අධිකරණයේ දිගින් දිගටම කරුණු ඉදිරිපත් කර ඇත. ඔහු දැනට කොවිඩ් රෝගයට ගොදුරු වී ඇති බවත්, ඔහු දැඩි රුධිර පීඩනයෙන් සහ දියවැඩියා රෝගයෙන් පෙලෙන බවත්, ඒ අනුව ඔහුගේ ජීවිත අවධානම තිබීමේ හැකියාව 80%කට වඩා වැඩි බවයි.

මෙම කාරණය පිළිබඳව කරුණු සළකා බැලීමේදී විශේෂයෙන්ම අධිකරණය සළකා බැලිය යුතු වන්නේ සැකකරුවෙකු සෞඛ්‍ය හේතූන් මත රක්ෂිත බන්ධනාගාරයේ තබන්නේ නම් ඔහු එලෙස බන්ධනාගාරයේ රඳවා තැබීමෙන් ඔහුගේ ජීවිතයට සහ සෞඛ්‍යයට එය අන්තරාකාරී ලෙස බලපාන්නේද යන සහතිකය මතයි. මෙම පලමු සැකකරු සම්බන්ධයෙන් පී5 ලෙස 2020.08.19 දින වෛද්‍ය ආනන්ද විජේවික්‍රම විසින් නිකුත් කරන ලද වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කර ඇත. එහිදී අධික රුධිර පීඩනය සහ දියවැඩියා රෝගය සඳහා ප්‍රතිකාර සඳහා පැමිණ

මහාධිකරණය ලේඛනාගාරය
09 DEC 2020
ගම්පහ.

Scanned with CamScanner

ඇති රෝගියෙකු බවත්, ඔහුගේ රුධිර පීඩනය සහ මුත්‍රා පරීක්ෂණ නිසියාකාරව ඉදිරියට පැවැත්විය බවටත් එම වෛද්‍යවරයා සඳහන් කර ඇත. එමෙන්ම 2020.06.21 දින ආසිරි රසායනාගාරය විසින් නිකුත් කර ඇති රුධිර පරීක්ෂණ වාර්තා තුනක් පී5-සී, පී5-බී, පී5-ඩී ලෙස ඉදිරිපත් කර ඇත. පී5-සී යනු කොලෙස්ටරෝල් වලට අදාලව ලබාගෙන ඇති රුධිර පරීක්ෂණ වාර්තාව වේ. පී5-බී යනු ආමාශ උදරයට අදාලව ලබාගෙන ඇති පරීක්ෂාවකි. පී5-ඩී යනු රුධිරයේ සීනි මට්ටම පැවැත්වීම සඳහා ලබාගෙන ඇති පරීක්ෂණයකි. ඒ අනුව රුධිරයේ සීනි මට්ටම 127.2ක් ලෙස සඳහන් වේ. කෙසේ හෝ එම කාරණා 2020.06.21 දිනට අදාල කරුණු වන අතර, සැකකරු බන්ධනාගාර ගතවීමෙන් පසුව වර්තමානයේ පවතින කාරණා ලෙස එය මත පිහිටා කටයුතු කල නොහැකි බවත්, කෙසේ හෝ අධිකරණය නිතැතින්ම සැළකිල්ලට ලක් කරන්නේ වර්තමානයේ සැකකරුගේ සෞඛ්‍ය තත්ත්වය ඔහුගේ ජීවිතයට හානිකර තත්ත්වයක පවතින්නේද යන කාරණාවයි.

කොවිඩ් වසංගත තත්ත්වය සමස්ථ ලෝකයට තර්ජනාත්මකව පවතින තත්ත්වයකි. ඒ අනුව එය බන්ධනාගාර තුල හෝ සමාජගතව තිබීමත්, එහි වැළඳීමේ අවධානම සමස්ථ සමාජයටම ඒකාකාරීව බලපා ඇති තත්ත්වයකි. එසේ හෙයින් එය <u>**සුවිශේෂී කාරණයක්**</u> ලෙස වර්තමානයේ සළකා බැලීම දුෂ්කර බව සඳහන් කළයුතුය.

මෙම නඩුවට අදාලව ඇප සම්බන්ධයෙන් විමසීම 2020.11.26 වන දින සිදුකරන ලද අතර, ඊට අදාල නියෝගය මා විසින් 2020.12.07

මහාධිකරණය ලේඛනාගාරය
09 DEC 2020
ගම්පහ.

Scanned with CamScanner

වන දින ලබාදෙන බවට නියම කර ඇත. එහෙත් මාගේ අසනීප තත්ත්වයක් හේතුකොටගෙන 2020.12.07 වන දින රාජකාරී නොකරන ලද අතර, එදින මෙම නඩුව කැඳවා 2020.12.09 වන දිනට නියෝගය සඳහා තබා ඇත.

එහෙත් මෙම නඩුවේ ගරු නීතිපති තුමා වෙනුවෙන් 2020.12.07 වන දින මෝසමක් ඉදිරිපත් කොට එම මෝසම මගින් නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල්වරයා මෙම අධිකරණයට මෙම පලමු සැකකරු සම්බන්ධයෙන් ජාතික බෝවන රෝග විද්‍යායතනයේ අධ්‍යක්ෂකවරයා විසින් නිකුත් කරන ලද ලිපියක පිටපතක් සහ එම ලිපියට අදාලව වෛද්‍ය ආනන්ද විජේවික්‍රම වෛද්‍යවරයා විසින් පලමු සැකකරුගේ වර්තමාන සෞඛ්‍ය තත්ත්වය පිළිබඳව කර ඇති නිර්දේශයේ වෛද්‍ය සහතිකයක්ද එයට අමුණා ඇත. ඒ අනුව එකී වෛද්‍ය සහතිකය මෙම නඩුවේදී මෙම අධිකරණයේ අවධානයට යොමු කර ඇති අතර, එම නව කරුණු අනාවරණය අධිකරණයට සහාය වීම පිණිස මෙම අධිකරණයට ඉදිරිපත් කරන ලද බවට වාර්තා කර ඇත. ඒ අනුව විශේෂඥ වෛද්‍ය ආනන්ද විජේවික්‍රම විසින් නිකුත් කර ඇති වාර්තාවට අනුව පලමු සැකකරුට යම් හෘද රෝගී තත්ත්වයක් තිබීඇති බව සහ ඒ අනුව එයට හේතුවී ඇත්තේ දුර ප්‍රවාහනය කිරීම, රෝහල් නොවන ස්ථානයකට ඇතුලත් කිරීම හේතුවෙන් බවද සඳහන් කර ඇත.

විශේෂයෙන්ම මෙම ඇප අයදුම් පත විමසීමට ගන්න අවස්ථාවේදී පලමු සැකකරුට කොවිඩ් රෝගය වැළදී ඔහු වැලිකන්ද ප්‍රදේශයේ

මහාධිකරණය ලේඛනාගාරය
09 DEC 2020
ගම්පහ.

Scanned with CamScanner

නිරෝධායන ස්ථානයට යැවූ බවට කරුණු ඉදිරිපත් කර තිබුණි. ඒ අනුව පෙනී යන්නේ මහර බන්ධනාගාරයේ සිට විශාල දුර ප්‍රමාණයක් ඇති රෝහලක් නොවන ස්ථානයකට ඇතුලත් කිරිම යන කාරණා හේතුවෙන් හෘද රෝගී තත්ත්වය ඇතිවී ඇති බවයි. කෙසේ හෝ මේ වන විට නැවත මෙම පලමු සැකකරු IDH රෝහල වෙත පසුව ගෙන්වා වර්තමානයේ ඔහු එම රෝහලේ ප්‍රතිකාර ලබන බවට සහ මේ වන විට නිසියාකාරයෙන් ප්‍රතිකාර සිදුකරන බවට වෛද්‍යවරයා සහතික කර ඇත.

කෙසේ හෝ මෙම විශේෂඥ වෛද්‍යවරයාගේ සහතිකයට අනුව පෙනී යන්නේ දැනට මෙම රෝගී තත්ත්වයන් නිසා පලමු සැකකරු රෝහලේ වෛද්‍ය ප්‍රතිකාර මත නිසියාකාරව කටයුතු කරගෙන යන බවයි. එහෙත් තවදුරටත් රක්ෂිත බන්ධනාගාර ගතකිරීමෙන් හෝ එම රෝහලේ රඳවා තැබීමෙන් මෙම පලමු සැකකරුගේ සෞඛ්‍යට සහ ජීවිතයට අනතුරුදායක තත්ත්වයක් පවතින බවට සහතිකයක් නැත. එසේ හෙයින් මෙම අවස්ථාවේදී පලමු සැකකරුට එම රෝගී තත්ත්වය යන කාරණය මත පමණක් පිහිටා කටයුතු කිරීමට මෙම අධිකරණයට නොහැකිය.

දෙවන සැකකරු සම්බන්ධයෙන් මා මුලින් සඳහන් කරන ලද පරිදි විශේෂයෙන් කරුණු පදනම් කරගෙන ඇත්තේ ඇප පනතේ 14 වන වගන්තියට අදාලව ඇප ප්‍රතික්ෂේප කිරීමට ඔහු වෙත කරුණු නොමැති බවයි. කෙසේ හෝ විශේෂයෙන්ම මා ඉහතින් සඳහන් කරන්නට යෙදී

මහාධිකරණය ලේඛනාගාරය
09 DEC 2020
ගම්පහ.

Scanned with CamScanner

ඇති පරිදි දෙවන සැකකරු සම්බන්ධයෙන්ද එම දක්වන ලද කරුණු එලෙසින්ම පිළිගැනීමට මෙම අධිකරණයට නොහැකිය.

විශේෂයෙන්ම ඉහතින් මා එලෙස සඳහන් කලේ මෙම සැකකරුවන් දෙදෙනාම සම්බන්ධයෙන් කරුණු සළකා බැලීමේදී සාක්ෂිකරුවන්ට බලපෑම් කිරීම සහ විමර්ශනවලට මැදිහත් වීමට ඇති නැඹුරුතාවය යන්න මෙම අධිකරණයේ අවධානයට ලක්ව ඇත. ඒ අනුව මෙම සැකකරුවන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ඉහල නිලධාරීන් වීම සහ විශේෂයෙන් පලමුවන සැකකරු එම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකවරයා ලෙස කටයුතු කිරීම, දෙවන සැකකරු සම්බන්ධයෙන් කරුණු සළකා බැලීමේදී සාක්ෂිකාර විල්ලවආරච්චි යන නිලධාරියා හැර අනෙකුත් නිලධාරීන් ඔවුන්ගේ පහළ නිලධාරීන් වීම යන කරුණු සළකා බැලිය යුතුය. එමෙන්ම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ විමර්ශනවලට මෙම සාක්ෂිකරුවන් දෙදෙනා සම්බන්ධ වී කටයුතු කර තිබීම සහ ඒ අනුව තොරතුරු පිළිබඳව වඩාත් දැනුම් සහගත තත්ත්වයක් ඔවුනට පවතින බව යන කාරණය සළකා බැලීමේදී සාමාන්‍ය පුද්ගලයෙකුට වඩා ඇති දැනුම සහ ඒවාට මැදිහත් වීමට සහ ප්‍රවේශ වීමට ඇති නැඹුරුතාවය යන කරුණු සළකා බැලිය යුතුය. ඒ අනුව මෙම සැකකරුවන් ව්‍යංග ලෙසින් හෝ විමර්ශනවලට බාධා විය හැකි අයුරින් කටයුතු කිරීමට ඇති හැකියාව යන කරුණු කෙරෙහි මෙම අධිකරණයේ අවධානය යොමු කරයි.

මහාධිකරණය ලේඛනාගාරය
09 DEC 2020
ගම්පහ.

Scanned with CamScanner

ඒ අනුව ඉහතින් සඳහන් කරන්නට යෙදුනු සියළුම කරුණු සළකා බලා සැකකරුවන් දෙදෙනාටම අදාලව පහත කරුණු පවතින බවට මෙම අධිකරණය නිගමනය කරයි.

01. මෙම නඩුවට අදාලව එක් සාක්ෂිකරුවන් කොටසක් පොලිස් සේවයේ නිරතවී සිටි නිලධාරීන් වන අතර, මුලින් වාස් ගුණවර්ධන යන නිලධාරියාට එරෙහිව ප්‍රකාශ ලබාදී පසුව සිදුවූ බලපෑම මත එලෙස අසත්‍ය ප්‍රකාශ කල බවට හා වර්තමානයේ පලමු සැකකරු ඇතුළු සැකකරුවන්ට එරෙහිව සත්‍ය ප්‍රකාශ කරන බවට ප්‍රකාශ ලබාදී තිබීම.

02. ඒ අනුව මතුවී ඇති සංකීර්ණභාවය සහ තවදුරටත් අනාවරණය විය හැකි සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශ ලබාගැනීමට අවශ්‍යතාවයක් මතුවී තිබීම.

03. සාක්ෂිකරුවන් කොටසක් සාමාන්‍ය සිවිල් වැසියන් සහ තවත් කොටසක් පලමුවන සැකකරුගේ පහල සේවයේ යෙදී සිටි නිලධාරීන් වීම සහ සාක්ෂිකාර විල්ලවආරච්චි හැර දෙවන සැකකරුගේද පහල නිලධාරීන් වීම නිසා ඔවුනට බලපෑම් කිරීමට ඇති හැකියාව සහ නැඹුරුතාවය. එමෙන්ම දැනටමත් සාක්ෂිකරුවන්ට වූ බලපෑම නිසා අසත්‍ය ප්‍රකාශ කිරීමට සිදුවූ බවට ප්‍රකාශ කර තිබීම.

අධිකරණ ලේඛනාගාරය
09 DEC 2020
ගම්පහ.

04. ඒ අනුව සාමාන්‍ය තත්ත්වය යටතේ සාක්ෂිකරුවෙකුට වන්නා වූ බලපෑම්වල ස්වභාවය යන මිණුම් දණ්ඩ මෙහිදී යොදා ගැනීමට නොහැකි බව.

05. දැනට හෙළිදරව් කර ඇති කරුණුවලට අනුව සහ රටේ වර්තමානයේ පවතින තත්ත්වය අනුව විමර්ශන ඉදිරියට පවත්වාගෙන යාමට සහ මතුවී ඇති සංකීර්ණභාවයන් නිසා අවම වශයෙන් විමර්ශනයට අදාලව සියළුම සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශ සටහන් කර ගැනීම සහ එමඟින් මතුවිය හැකි විද්‍යාත්මක සාක්ෂිවලට අදාලව විමර්ශන අවසන් කිරීමට තවදුරටත් සාධාරණ කාලයක් පැමිණිලි පාර්ශ්වය ඉල්ලා සිටීම සාධාරණ සහ යුක්ති සහගත වීම.

06. සැකකරුවන් සාක්ෂි සහ විමර්ශනවලට බලපෑම් නොකරන්නේය යන්න දැනට ඉදිරිපත් වී ඇති කරුණු අනුව නිගමනය කිරීමට දුෂ්කර බව.

07. ඒ අනුව දැනට ඉදිරිපත් වී ඇති කරුණුවල සමස්ථය අනුව ඇප පනතේ 14 1(අ) (ii) වගන්තියේ කරුණු වලට අනුව සැකකරුවන් සම්බන්ධයෙන් කරුණු සැළකිය යුතු බවට මෙම අධිකරණය නිගමනය කරන අතර, ඒ අනුව එකී හේතූන් මත මෙම

මහාධිකරණය ලේඛනාගාරය
09 DEC 2020
ගම්පහ.

Scanned with CamScanner

අවස්ථාවේදී සැකකරුවන්ට ඇප ලබාදීම නුසුදුසු

බවට මෙම අධිකරණය තීරණය කරයි.

ඒ අනුව සැකකරුවන් දෙදෙනාටම අදාලව ඇප ඉල්ලීම ප්‍රතික්ෂේප

කරමි.

අත්සන් කලේ:-

**(නිමල් රණවීර)**

**මහාධිකරණ විනිසුරු - ගම්පහ**

**2020.12.09**

::::::::::::::::::::::::::::

ඉහත සඳහන් වන්නේ ගම්පහ මහාධිකරණ නඩු අංක 339/2020/ඇප දරණ නඩුවේ 2020.12.09 දිනැති නියෝගයේ සත්‍ය පිටපතක් බවට සහතික කරමි.

සැකසුවේ :-

සැසඳුවේ :-

රෙජිස්ට්‍රාර්.

රෙජිස්ට්‍රාර්
මහාධිකරණ
ගම්පහ.

මහාධිකරණය ලේඛනාගාරය
09 DEC 2020
ගම්පහ.

6/25 560270
2020/12/09

Scanned with CamScanner